මැරින්ටයිම් පත්තු ප්‍රාදේශිය සභාව

මුලතිව් දිස්ත්‍රික්කය.

-----------------------------------------------------------

1. මූල්‍ය ප්‍රකාශ.

----------------

1.1 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම

--------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2014 මාර්තු 31 දින විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2013 අප්‍රේල් 13 දින ඉදිරිපත් කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 නොවැම්බර් 25 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදී.

1.2 මතය

-----------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දැක්වෙන කරුණු වලින් මූල්‍ය ප්‍රකාශයන්ට වන බලපෑම හැර, 2013 දෙසැම්බර් 31 දිනට මැරින්ටයිම් පත්තු ප්‍රාදේශිය සභාවේ වැඩකටයුතු වල තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් වල මූල්‍ය ප්‍රතිඵල සහ මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදු සම්මත ගිණුම්කරණ මූලධර්මයන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම්

----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

--------------------------

i. මූල්‍ය ප්‍රකාශයන්හි නිරීක්ෂණය වූ ගිණුම්කරණ අඩුපාඩු වගකීම් යටතේ පහත වගුවෙහි දැක්වේ.

| මූල්‍ය ප්‍රකාශ කෙරෙහි බලපෑම | වගකීම් | |
|---|---|---|
| | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම |
| | රු. | රු. |
| වැඩියෙන් දැක්වීම් | 02 | 15,230,361 |
| අත්හැරීම් | 03 | 5,360,682 |

ii. සභාවට පරිත්‍යාග කරන ලද විෂයයන් විසිහතක් අගය කර අවසාන ගිණුම් වලට ගෙන නොතිබුණු බැවින් ගිණුම් වල වාහන වල අගය අඩුවෙන් දක්වා තිබුණ.

### 1.3.2 නොසැසඳු ගිණුම්

ප්‍රධාන ලෙජරය අනුව ගිණුම් 4 ශේෂයන්ගේ එකතුව රු.21,115,744 ක් වු අතර අවසාන ගිනුම් අනුව අගය රු.2,141,535 ක් විය.

### 1.3.3 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම

අවශ්‍ය තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් නොකිරීම නිසා වටිනාකම රු.75,872,911 ක් වු ගනුදෙනු විගණනයේදි සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

### 1.3.4 අනුකූල නොවීම

නීතිරීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන්ට අනුකූල නොවූ පහත සඳහන් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති,රීති, රෙගුලාසි වලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභා (මුල්‍ය සහ පරිපාලන) රීති - 1989 | | |
| | (i) II පරිච්ඡේදයේ 5 වගන්තිය | - | මුදල්, ගබඩා ආදිය භාරව කටයුතු කරන නිලධාරීන්ගෙන් ආරක්ෂක තැන්පතු ලබාගෙන නොතිබුණි. |
| | (ii) III පරිච්ඡේදයේ 59 වගන්තිය | - | ව්‍යාපාර බදු පිළිබඳව සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |
| | (iii) V පරිච්ඡේදයේ 140 වගන්තිය | - | රු.110,800 ක් වූ නිරවුල් නොකළ අත්තිකාරම් සම්බන්ධයෙන් ලේකම්වරයා කටයුතු කර නොතිබුණි |
| (ආ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 132(එච්) වගන්තිය | - | සංග්‍රහ වියදම් සඳහා අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබාගත යුතුය. කෙසේ වුවද එවැනි අනුමැතියකින් තොරව සභා අරමුදලෙන් රු.33,588 ක මුදලක් වැයකර තිබුණි. |
| (ඇ) | <u>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි</u> | | |
| | (i) මුදල් රෙගුලාසි 571 | - | වර්ෂ 2 ක් ඉක්මවූ රු.50,296 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| | (ii) මුදල් රෙගුලාසි 102 හා 105 | - | සමාලෝචිත වර්ෂය තුලදී අංක WPRB 4169 දරන සීසෑමේ යන්ත්‍රය නැති වී තිබුණි. නමුත් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

## 2. මුල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මුල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මුල්‍ය ප්‍රකාශ අනුව, සමාලෝචිත වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම් අතිරික්තය රු.10,592,675 ක් වූ අතර එයට අනුරූපව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම් අතිරික්තය රු.13,516,199 ක් විය.

### 2.2 මුල්‍ය පාලනය

අයවැය ලේඛනය නිසි පරිදි පිළියෙල කර නොතිබුණි. එබැවින් අයවැයගත ආදායම් සහ වියදම් හා තථ්‍ය ආදායම් සහ වියදම් අතර පිළිවෙලින් රු.4,911,566 ක් සහ රු.8,864,971 ක් වූ වෙනස්කම් නිරීක්ෂණය විය.

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම

සභාපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද පරිදි සමාලෝචිත වර්ෂය සඳහා වූ ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් සහ බදු | 140 | 396 | - |
| බදු කුලී | 10,210 | 12,262 | - |
| බලපත්‍ර ගාස්තු | 2,380 | 6,051 | - |
| වෙනත් ආදායම් | 29,087 | 28,020 | 4,847 |
| | 41,817 | 46,729 | 4,847 |

2.3.2 උසාවි දඩ

--------------

සමාලෝචිත වර්ෂය සඳහා ලැබිය යුතු උසාවි දඩ රු.4,847,036 ක් ගිණුම් ගතකර තිබුණු නමුත් එම මුදල් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

2.3.3 මුද්දර ගාස්තු

---------------

2010 සිට 2013 දක්වා කාල පරිච්ඡේදයට අදාළ රු.3,566,980 ක් වු මුද්දර ගාස්තු ගිණුම් ගතකර නොතිබුණි.

2.4 ආදායම් කළමනාකරණය

-------------------------------

ප්‍රාදේශිය සභා ප්‍රදේශය තුල වු විදුලි සංදේශ කුළුණු 4 ක් වෙනුවෙන් බලපත්‍ර ගාස්තු අයකර ගෙන නොතිබුණි.

2.5 වත්කම් කළමනාකරණය

--------------------------------

2.5.1 කාර්ය මණ්ඩල ණය

--------------------------

වර්ෂ 5 කට අධික කාලයක සිට විශ්‍රාම ගිය/මියගිය නිලධාරීන්ගේ රු.564,048 ක් වූ කාර්ය මන්ඩල ණය අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි. අවම වශයෙන් එම ණය ඇපකරුවන්ගෙන් හෝ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.5.2 සමික්ෂණ මණ්ඩල වාර්තා

--------------------------------

(i)

(ii) කාර්යාලයේ වු විෂයයන් 6 ක් ඉන්වෙන්ට්‍රි රෙජිස්ටරයේ සටහන් කර නොතිබුණි.

2.5.3 ඌණ උපයෝජනය

-------------------------

(i) සභාවට අයත් වාහන 3 ක් වර්ෂ 2 ක කාලයක් නිශ්ක්‍රීයව පැවති බව විගණනයේදි නිරික්ෂණය විය.

(ii) ප්‍රධාන කාර්යාලයේ ගබඩාවේ වූ පරිත්‍යාග වශයෙන් ලද පහත සඳහන් විෂයයන් නිශ්ක්‍රීයව පැවතුණි.

| පරිත්‍යාග කළ ආයතනය | විෂයය | ප්‍රමාණය | නිශ්ක්‍රීය කාලය |
|---|---|---|---|
| UNICEF | අත්කරත්ත | 58 | 2011 වර්ෂයේ සිට |
| | උදළු | 144 | 2011 වර්ෂයේ සිට |
| පළාත් පාලන දෙපාර්තමේන්තුව | විදුලි ජනන යන්ත්‍ර | 2 | 2011 වර්ෂයේ සිට |
| මුලතිව් දිසාපති | TVS යතුරු පැදි (WPUZ 2747) | 1 | 2012 වර්ෂයේ සිට |

2.6 කොන්ත්‍රාත් පරිපාලනය

-------------------------------

2.6.1 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදය

--------------------------------------------

මුදල් වර්ෂය තුල ක්‍රියාත්මක කළ යුතු වූ රු.7,985,400 ක් වූ ව්‍යාපෘති 4 ක් ක්‍රියාත්මක කර නොතිබූ අතර එම මුදල විවිධ ණයගැති ගිණුමෙහි ඇතුලත් කර තිබුණි.

2.6.2 අත්හරින ලද ව්‍යාපෘති

---------------------------

වටිනාකම රු.4,200,000 ක් වූ සභාවේ ප්‍රාග්ධන ව්‍යාපෘති 3 ක් සමාලෝචිත වර්ෂය තුල ක්‍රියාත්මක කර නොතිබුණු අතර රු.3,000,000 ක් ස්ථාවර තැන්පතු වල ආයෝජනය කර තිබුණි. මේ නිසා මහජනතාවට ලැබිය යුතු ප්‍රතිලාභ අහිමි වී තිබුණි.

2.6.3 අයවැය ලේඛනයේ අනුමත නොකළ ප්‍රාග්ධන ව්‍යාපෘති

-------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂය තුල අයවැය ලේඛනයේ අනුමත නොකළ ව්‍යාපෘති 7 ක් සහා අරමුදලෙන් රු.17,687,359 ක් වැයකොට ක්‍රියාත්මක කර තිබුණි.

3. පද්ධති සහ පාලන

-------------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් සභාවේ විශේෂ අවධානය යොමුවිය යුතුය.

(i) අයවැය ලේඛනය
(ii) ආදායම් රැස් කිරිම
(iii) වාහන උපයෝජනය
(iv) විවිධ ණයගැතියෝ
(v) තැන්පතු